**ජාතික ලොතරැයි මණ්ඩලය - 2022**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1963 අංක 11 දරන මුදල් පනතේ 14(3)(ඒ) වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් පවත්වන ලද ජාතික ලොතරැයියක දිනුම් අදිනු ලැබූ දින සිට ගණන් බලනු ලබන මාස හයක කාලයක් ඉකුත්වීමෙන් පසුව ඒ ජාතික ලොතරැයියේ යම් ත්‍යාගයකට හිමිකම් ඇති තැනැත්තා සොයාගත නොහැකිවීම හේතු කොටගෙන ප්‍රදානය කර නොමැති යම් ත්‍යාගයක් රාජ්‍ය සන්තක කරනු ලැබිය යුතු බව සඳහන් වුවත්, 2022 ජනවාරි 27 දින සිට 2022 ජුනි 30 දින දක්වා හඳහන ලොතරැයියේ අමතර ලග්නය වෙනුවෙන් ලබාදෙන ලද තෑගි මුදල්වලින් මාස 06 ඉක්මවා හිමිකම් නොපෑ රු.11,879,880 ක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර මණ්ඩලයේ අරමුදල තුළ රඳවාගෙන තිබුණි. කෙසේවුවද, ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු මෙම මුදල් සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයට ගෙවිය යුතු වගකීමක් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි. | මෙම ත්‍යාගයන් වරින් වර හඳුන්වා දුන් පාරිභෝගික ප්‍රවර්ධන ත්‍යාගයන් වන අතර ප්‍රධාන ත්‍යාග රටාව තුළ අන්තර්ගත ත්‍යාග නොවේ. එබැවින් මෙම ත්‍යාගයන් අහිමි කල ත්‍යාග යන ත්‍යාග කාණ්ඩයට අයත් නොවේ. | ජාතික ලොතරැයි මණ්ඩල පනත අනුව මණ්ඩලය විසින් පවත්වන සෑම ලොතරැයියකම මාස 06 ඉක්ම වූ හිමිකම් නොපෑ ත්‍යාග මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට වගකීමක් ලෙස ගිණුම් ගත කළ යුතු වීම. |
| (ආ) | 2022 ජුලි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා හඳහන ලොතරැයියේ | හඳහන ලොතරැයිපතෙහි අමතර ලග්නය දිනුම් ඇදීම සිදු කරනු | සෑම ලොතරැයියකම මාස 06 ඉක්මවා නැති හිමිකම් |

| | | | |
|---|---|---|---|
| | අමතර ලග්නය වෙනුවෙන් ලබාදෙන ලද තෑගි මුදල්වලින් මාස 06 ඇතුළත හිමිකම් නොපෑ රු.25,921,120 ක් වෙනුවෙන් අවශ්‍ය වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ලබන්නේ ප්‍රධාන ත්‍යාග රටාවෙන් පරිබාහිරව විශේෂ ත්‍යාගයක් ලෙස වේ. මෙම පාරිභෝගික ප්‍රවර්ධන ත්‍යාගයන් නැවත එම සංචිත අරමුදලටම බැර කරනු ලබන අතර නැවත ඉදිරි ත්‍යාගයන් සඳහා එම මුදල් භාවිතා කරනු ලබයි. | නොපෑ ත්‍යාග මුදල් සඳහා අවශ්‍ය වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු වීම. |
| (ඈ) | අලෙවි කුටි සැකසීම, අලෙවි කුටි සන්නම් කිරීම සහ නිර්මාණ ආකෘති සැකසීම වෙනුවෙන් රු.665,771 ක් මණ්ඩලය විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙත ගෙවිය යුතුව තිබුණත්, එම වගකීම මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ ප්‍රතිපාදනයන් උපචිත වියදම් යටතේ ඇතුළත් කිරීම අතපසු වීමකින් මඟහැරී ඇති බව දන්වා සිටින අතර මෙම වසර තුළ අදාළ පියවීම් කටයුතු සිදු කිරීමත් ඊට අදාළ ගැලපීම් නිසි පරිදි සිදු කිරීමටත් නියමිතය. | මණ්ඩලය විසින් ගෙවිය යුතු වගකීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකළ යුතු වීම. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සහ අනුරූපි වාර්තා අනුව සුපිරි වාසනා ලොතරැයි සංචිත ශේෂයේ සහ මාස 6 ඉක්ම වූ හිමිකම් නොපෑ ත්‍යාග වටිනාකම් ශේෂයන් අතර පිළිවෙළින් රු.378,500 ක හා රු.25,641,271 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන තුළ වූ රු.233,055,845 ක් වූ පැසිච් හා ක්ෂණික ලොතරැයි ණයගැතියන් 118 ක් අතුරින් 2022 දෙසැම්බර් 31 දිනට විගණනය වෙත ශේෂ තහවුරු කිරීම් සිදුකර තිබුණේ රු.16,440,443 ක් වූ ණයගැතියන් 08 ක් පමණි. ඒ අනුව පැසිච් හා ක්ෂණික ලොතරැයි ණයගැතියන් එකතුව රු.216,615,402 ක්වූ ණයගැතියන් 110 ක් 2022 දෙසැම්බර් 31 දිනට විගණනය වෙත ශේෂ තහවුරු කිරීම් සිදු කර නොතිබුණි. | සෑම වසරකම දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය සනාථ කර එවීම සඳහා ලිපි යවන නමුත් ශේෂය සනාථ කර නැවත දැන්වීමක් ප්‍රායෝගිකව බහුතරයක් විසින් සිදු නොකරයි. | මණ්ඩලය ණය ගැතියන්ගෙන් ශේෂ සනාථ විගණනයට ලබාදීම සඳහා සහයෝගය ලබාදිය යුතු අතර අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |
| (ආ) | විගණනය වෙත ශේෂ තහවුරු කිරීම් සිදුකල ණයගැතියන් අතුරින් ණයගැතියන් දෙදෙනෙකු පමණක් අදාල ශේෂ සමඟ එකඟ වී තිබුණු අතර රු.1,964,108 ක් වූ ණයගැතියකුගේ ශේෂය නිවැරදි නොවන බව දන්වා තිබුණි. එසේම ඉතිරි ණයගැතියන් 05 ම | ලොතරැයි සඳහා අය විය යුතු වටිනාකම් සඳහා ණයගැතියන් විසින් 2023 වර්ෂයේ පළමු කාර්තුව තුළ පියවීම් කටයුතු සිදු කර ඇත. | ශේෂයන් අතර වෙනස්වීම්වලට හේතු පරික්ෂා කර ගිණුම් නිවැරදි කිරීම හා අයවිය යුතු මුදල් අයකර ගැනීම කඩිනම් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ඔවුන්ට එවැනි ණය මුදලක් ගෙවීමට නොමැති බව දක්වා තිබුණි. ඒ අනුව අදාල ණයගැතියන් 5 ට අදාළව පමණක් ණයගැති ශේෂයේ රු.8,691,754 ක වෙනසක් නිරීක්ෂණය විය. | | |
| (ඇ) | සෘජුවම ලොතරැයිපත් අදාල ගැණුම්කරුවන් වෙතම අලෙවි කළ කලම්බු එයාර්පෝට් සුපර් ඩ්‍රෝ රු.4,510,280 ක් සහ ඩොලර් ෆෝචූන් රු.964,678 ක ලොතරැයිපත්වලට අදාලව 2022 දෙසැම්බැර් 31 දිනට වූ ණයගැතියන්ට අදාළ ශේෂ ලැයිස්තුවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට කළම්බු එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය සඳහා රු.4,510,280 ක් සහ ඩොලර් ෆෝචූන් ලොතරැයියට අදාළව රු.964,678 ක ණයගැති ශේෂයක් පවතී. | මණ්ඩලයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතු වීම. |
| (ඈ) | විවිධ කාර්යයන් වෙනුවෙන් බාහිර පාර්ශවයන් තුනක් වෙත ලබා දී තිබූ අත්තිකාරම්වලින් එකතුව රු.1,141,490 ක් වූ අත්තිකාරම් 02 ක් 2019 වර්ෂයේ සිට හා රු.10,000 ක ශේෂයක් 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අය නොවී පැවතුණි. | 2019 වසරට අදාලව රු.1,141,490 ක්වූ නිරවුල් නොවූ අත්තිකාරම් මුදල, ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ලබා දුන් රු.126,000 ක මුදල, සමාගම වෙත ලබා දුන් රු.1,005,490 ක මුදල සහ තක්සේරු දෙපාර්තමේන්තුවට ලබා දුන් රු.10,000 ක මුදලකි. | මණ්ඩලයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කලයුතු වීම. |
| (ඉ) | 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අලෙවි කුටි සෑදීම වෙනුවෙන් අලෙවි නියෝජිතයින් 51 ක් වෙත ලබාදුන් මුදලින් රු.450,958 ක් 2022 දෙසැම්බර් 31 දිනට අය නොවී පැවතුණි. | මෙම වසර අවසානයේදී මෙම මුදල් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පියවීම සිදු කරයි. | අප්‍රමාදව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු වීම. |
| (ඊ) | මණ්ඩලයේ හිටපු නිලධාරීන් විසින් නැවත භාර නොදුන් වත්කම් වෙනුවෙන් අයකර ගත යුතු රු.275,908 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දි වන විටත් අයකර ගැනීමට අපොහොසත්ව තිබුණු අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ විවිධ ලැබිය යුතු ආදායම් යටතේ දක්වා තිබුණි. | මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අවධානය යොමු කර අදාල නිලධාරියාගෙන් අයකර ගැනීමටත් එසේ නොවුනහොත් නීත්‍යානුකූල පියවර ගැනීමටත් තීරණය කර ඇත. | අප්‍රමාදව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු වීම. |
| (උ) | මූල්‍ය ප්‍රකාශනවල සේවක ණය යටතේ දක්වා තිබූ මියගිය, වැඩ තහනම් කල හා සේවය හැර ගොස් සිටින සේවකයන්ගෙන් අයවිය යුතු උත්සව අත්තිකාරම් රු.34,840 ක්, ආපදා ණය රු.645,132 ක් හා නිවාස ණය රු.1,521,196 ක් ලෙස එකතුව රු.2,201,168 ක් අයකර ගැනීමට 2022 දෙසැම්බර් 31 දින වන විටත් අපොහොසත්ව තිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | අප්‍රමාදව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු වීම. |

| | | |
|---|---|---|
| (ඌ) මණ්ඩලයේ කාර්යමණ්ඩලයට පානීය ජලය සැපයීම වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අවස්ථා 6 කදී ආයතනයක් වෙත ගෙවීම් කර තිබූ රු.102,500 ක තැන්පතුවක් නිරවුල්කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් ගෙන නොතිබුණි. | ජාතික ලොතරැයි මණ්ඩලය වෙත 2010 වසරේ සිට 2014 වසර දක්වා වසර 05 කට ආසන්න කාලයක් සඳහා පුද්ගලික සමාගමක් වෙත ජල බෝතල් සැපයීමේ කොන්ත්‍රාත්තුව ලබාදී ඇති අතර, ඒ සඳහා අවස්ථා 06 කදී තැන්පතු මුදල් අප ආයතනය මඟින් තැන්පත් කර ඇති බව ලේඛණ මඟින් අනාවරණය වේ. | අප්‍රමාදව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු වීම. |
| (එ) අලෙවි නියෝජිතයකු වෙත 2015 වර්ෂයේ දී ලබාදුන් මෝටර් බයිසිකලයක් වෙනුවෙන් අයවිය යුතු රු. 65,000 ක් 2022 දෙසැම්බර් 31 දිනට අය නොවී පැවතුණි. | රු.65,000 ක මුදල මෙම වර්ෂය තුල අයකර ගැනීමට හැකිවන පරිදි ඔහු එකඟ කරවා ගෙන ඇති අතර ඒ අනුව එම සාමාජික මුදල අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | අප්‍රමාදව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු වීම. |
| (ඒ) 2020 වර්ෂයේ දී පරිගණක හා මෙවලම් සඳහා අලෙවි නියෝජිතයින් වෙත ලබාදුන් මුදලින් 2022 දෙසැම්බර් 31 දින වන විට රු.92,336 ක් තව දුරටත් අය නොවී පැවතුණි. | අදාළ දිස්ත්‍රික් අලෙවි නියෝජිත ධූරය වසර කිහිපයකට පෙර අක්‍රියව පැවතීම නිසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගිණුමින් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | අප්‍රමාදව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු වීම. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් වෙත අලෙවි කුටි ලබාදීම සඳහා 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල අයකරගත් රු.1,941,900 ක මුදලක් අදාල පාර්ශවයන් වෙත අලෙවි කුටි ලබා දීමකින් හෝ මුදල් නිරවුල් කිරීමකින් තොරව පැවති අතර එම ශේෂය තවදුරටත් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | සහනදායී පදනම මත ලබා දෙන ලද අලෙවි කුටි වෙනුවෙන් අලෙවි නියෝජිතයින් විසින් මූලිකව ගෙවිය යුතු මුදල මණ්ඩලය වෙත තැන්පත් කර ඇති අතර 2023 වසර තුල නව අලෙවි කුටි ලබා දීමට සැලසුම් සකස් කර ඇත. | අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කලයුතු වීම. |
| (ආ) දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් විසින් අලෙවි කරන ලොතරැයිපත් වෙනුවෙන් ගෙවනු ලබන සේවා ගාස්තුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට අදාළ දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් වෙත ගෙවිය යුතු රු.3,305,181 ක මුදලක් රැඳවුම් මුදල් වශයෙන් රඳවාගෙන තිබුණි. මෙම ශේෂය තුළ 2011 වර්ෂයේ සිට විවිධ | මෙම රඳවා ගත් මුදලින් මණ්ඩලයට අයවිය යුතු ණය වෙනුවෙන් රු.353,286 ක මුදලක් අඩුකරගෙන ඇත. | අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අවස්ථාවලදී අදාල නියෝජිතයින්ගෙන් රඳවාගත් සේවා ගාස්තු ඇතුලත් වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම රැඳවුම් මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඇ) | ජයග්‍රාහකයින් වෙත තෑගි ලබාදීම වෙනුවෙන් ජයග්‍රාහී ලොතරැයිපත් ස්කෑන් කිරීම සඳහා මණ්ඩලය විසින් අදාල අලෙවි නියෝජිතයින් 50 ක් වෙත ගෙවිය යුතු මුදල රු.3,920,676 ක් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් කර නොතිබුණු අතර ඉන් සියයට 99 ක් එනම් රු.3,867,101 ක් වසරකට වඩා වැඩි කාලයක සිට පැවැත එන ශේෂයන් වී තිබුණි. | රු.1,161,727 ක මුදලක් ණය හිලව් කිරීමට අදාලව කටයුතු කිරීමට නියමිතය. රු.646,632 ක මුදල අදාල වන්නාවූ දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් තිදෙනෙකුගේ මුදල් ඉදිරි ණය පියවීම සඳහා රඳවා තබා ගැනීමටත් ඉතිරි මුදල මීළඟ කාර්තුවේදී ගෙවා අවසන් කිරීමටත් කටයුතු කරනු ඇත. | අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කලයුතු වීම. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීවයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) වගන්තිය හා 1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනතේ 17(2) වගන්තිය | ලොතරැයි ආදායමෙන් පනතේ නිශ්චිතව දක්වා ඇති වියදම් අඩුකළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට රඳවාගත් ලාභ එකතුව වූ රු.2,396,866,790 ක් එලෙස ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් තොරව, 2022 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය තුළ රඳවා ගෙන තිබුණි. | මුදල් පනත හා සංශෝධිත පනත් සමඟ කියවෙන වගන්ති අනුව මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති මඟපෙන්වීම මත එක් එක් ලොතරැයිපත් අලෙවියෙන් ප්‍රතිශතාත්මකව මුදල් මාසිකව ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සිදු කරයි. | අදාල පනතේ විධිවිධාන අනුගමනය කලයුතු වීම. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | රජයේ නීතිගත සංස්ථාවක කිසිම මුදලක් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මිස ආයෝජනය කරනු නොලැබිය යුතු වුවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.5,511,647,458 ක් හා රු.1,729,638,584 ක් | ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ආයෝජනය කරන්නේ ත්‍යාග ගෙවීම් සඳහා සංචිතව පවතින මුදල් වන අතර දිනුම් ලැබූ ටිකට්පත් වලංගු කාලය මාස 06 ක් වන තෙක් ත්‍යාග සඳහා හිමිකම් ඇති බැවින් එතෙක් එම මුදල් තාවකාලිකව අදාල ගිණුම් | අදාල පනතේ විධිවිධාන විධිවිධාන අනුගමනය කලයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | පිළිවෙලින් ස්ථාවර තැන්පතුවල හා කාලීන තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | වල පවතී. | |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15(2) හා (3) ඡේද | මණ්ඩලය විසින් 1998 වර්ෂයේදී අසරණ සරණ නමින් අරමුදලක් ආරම්භ කර තිබුණි. එම අරමුදලට ලොතරැයි ත්‍යාගලාභීන්ගේ පරිත්‍යාගවලින් හා ලොතරැයි අලෙවි ආදායමෙන් සියයට 0.005 ක ප්‍රමාණයක ලැබීම් බැර කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ ශේෂය රු.26,580,127 ක් වී තිබුණි. මෙලෙස විශේෂිත අරමුදලක් පවත්වාගෙන යාම සඳහා චක්‍රලේඛ විධිවිධාන පරිදි අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර ඒකාබද්ධ අරමුදලට බැරවිය යුතු මුදල් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මණ්ඩලය වෙත රඳවාගෙන තිබුණි. | අසරණ සරණ අරමුදල භාවිතා කරමින් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය යටතේ ජාතික ලොතරැයි මණ්ඩලයේ දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දූවා දරුවන් වෙනුවෙන් සහ ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවය කරමින් සිටියදී මිය ගිය කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දූවා දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ සහ පොත්පත් ලබා දීම සිදු කරන ලදී. මෙම වසර අවසාන වන විට සුභසාධන කටයුතු සඳහා අරමුදල් යෙදීමෙන් මෙම අරමුදල් අවසන් කිරීමට නියමිතය. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළයුතු වීම. |
| (ඈ) | ජාතික ලොතරැයි මණ්ඩලයේ 1963 අංක 11 දරන මුදල් පනතේ 17(2) වගන්තිය හා 1993 ජනවාරි 21 දිනැති අංක PE1/70/7/Vo11 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලු ලොතරැයි ආදායමෙන් සියයට 16.5 ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබූ ලොතරැයි 11 කින් නියමිත ප්‍රතිශතයට වඩා අඩුවෙන්, එනම් සියයට 10 ක වටිනාකමක් පමණක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීම නිසා තවදුරටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වටිනාකම රු.560,218,552 ක් වී තිබුණි. | මෙම ලිපියට අනුව නම්කර තිබූ ලොතරැයිපත් ද්විත්වය වන මහජන සම්පත හා වාසනා සම්පත ලොතරැයිපත් සඳහා සියයට 16.5 දායකත්වයක් ඒකාබද්ධ අරමුදලට ලබා දුන් අතර ඉන්පසු ආරම්භ කරන ලද ලොතරැයිපත් ආරම්භයේදී සියයට 16.5 ක්වූ ප්‍රතිශතය ඒකාබද්ධ අරමුදලට ලබාදීම මඟින් ලොතරැයි පවත්වා ගැනීම අලාභදායි වීම මත සියයට 10 ක ප්‍රතිශතයක් එකී ලොතරැයිපත් සඳහා අඛණ්ඩව ලබාදීම සිදු කරයි. | අදාල ලිපියේ විධිවිධාන අනුව කටයුතු කලයුතු වීම. |

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006

| | | | |
|---|---|---|---|
| (i) 4.2.1 (ආ) සහ (ඇ) වගන්තිය | ඊළඟ එළඹෙන වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව දක්වමින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කරගත යුතු වුවත්, විගණනයට භාජනය කළ 2019 සිට 2023 දක්වා මණ්ඩලයේ ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීමට අදාල ප්‍රසම්පාදන කාර්යයන් ඇතුළත් විස්තරාත්මක ප්‍රම්පාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. | ව්‍යාපාරයක් ලෙස පවත්වා ගන්නා වූ ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි අලෙවිය, වෙළඳපල හැසිරීම අධ්‍යයනයකර වාර්ෂිකව ප්‍රසම්පාදන කටයුතු සිදු කල යුතුය. ඒ අනුව අලෙවි සහ ලෙවිකරණ සැලසුම් රටේ පවත්නා ආර්ථික රටාව සැලකිල්ලට ගනිමින් වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන රේඛීය අමාත්‍යාංශයේ දැන ගැනීම සඳහා යොමු කරනු ලබයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුගමනය කලයුතු වීම. |
| (ii) 4.3 වගන්තිය | ප්‍රසම්පාදනයට අදාල මුළු පිරිවැය ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වුවත්, ලොතරැයි වර්ග 09 ක් මුද්‍රණය කරවා ගැනීමට අදාළ මුළු පිරිවැය නිවැරදිව හඳුනා නොගෙන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් එම ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණද, නිවැරදි පිරිවැයට අනුව මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකළ යුතු බව දක්වමින් පසුව අවලංගු කර තිබුණි. | මෙම ප්‍රසම්පාදනය ආරම්භ කරන අවස්ථාවේදී ඒ සඳහා වැය වේ යැයි අපේක්ෂා කරනු ලබන පිරිවැය අමාත්‍යාංශ ප්‍රසම්පදාන කමිටු සීමාව ඉක්මවා යාම නිසා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු සීමාව වෙත යොමු කිරීමට ඉහත අමාත්‍යාංශයේ ප්‍රසම්පදාන කමිටු නිර්දේශ ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුගමනය කලයුතු වීම. |
| (iii) 4.2.3 වගන්තිය | ප්‍රසම්පාදන කටයුතුවල එක් එක් පියවරයන් සඳහා ගතකරන කාලය නිවැරදිව | 2020 වර්ෂයේ සිට රට තුල ව්‍යාප්ත වූ කොරෝනා වසංගත තත්ත්වය සහ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ |

| | | | | |
|---|---|---|---|---|
| | | තීරණය කරමින් එම කාලවකවානු තුළ අදාල කාර්යයන් සම්පූර්ණ කිරීමට කටයුතු කළයුතු වුවත්, මණ්ඩලයේ 2021 ජුනි 25 දින ආරම්භකර තිබූ ලොතරැයි වර්ග 09 ක් මුද්‍රණය කරවාගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු 2023 පෙබරවාරි අවසානය වන විට වසර 01 යි මාස 08 ක් ගත වී තිබුණද, ලොතරැයිපත් මුද්‍රණ කටයුතු සඳහා සැපයුම්කරුවකු වෙත ලංසු ප්‍රදානය කිරීමට අපොහොසත් වී තිබුණි. | 2022 වර්ෂයේදී රට තුල ඇති වූ ඩොලර් අර්බුදය වැනි ප්‍රසම්පාදන අස්ථිත්වය වෙත පාලනය කල නොහැකි කරුණු මත ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ආරම්භ කරන ලද ලොතරැයිපත් මුද්‍රණ ප්‍රසම්පාදන පිරිනැමීම ප්‍රමාදවීම සිදු වී ඇති අතර 2023 අප්‍රේල් 01 දින සිට එක් වර්ෂයක කාල පරිච්ඡේදයක් සඳහා මෙම ප්‍රසම්පාදනයේ මුද්‍රණ කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කර ඇත. | මාර්ගෝපදේශ අනුගමනය කල යුතු වීම. |
| (iv) | 4.4 වගන්තිය | මණ්ඩලයේ වාර්ෂික මුද්‍රණ අවශ්‍යතාවය හඳුනාගෙන එම අවශ්‍යතාවය මිලදීගැනීමට ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක නොකර කෙටිකාලීනව එනම් මාසයක හෝ මාස කීපයක මුද්‍රණ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි. මෙම තත්ත්වය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 පරිදි ප්‍රසම්පාදන අධිකාරි සීමාවන් මඟහැරීමට හේතුවී තිබුණි. | ප්‍රසම්පාදන අස්ථිත්වයට පාලනය කල නොහැකි හේතූන් මත වසරක කාලයක් වෙනුවෙන් ලොතරැයිපත් මුද්‍රණය සඳහා මුද්‍රණකරුවන් තෝරා කොන්ත්‍රාත් පිරිනැමීම කල්ගත වීම හේතුවෙන් එම ප්‍රසම්පාදනය අවසන් කිරීමට ගත වන කාල සීමාවන් පිළිබඳව සලකා බලා ලොතරැයිපත් වෙළඳපොලට අඛණ්ඩව සැපයීමේ අරමුණින් අතරමැදි ප්‍රසම්පාදන කිහිපයක් සිදු කිරීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුගමනය කලයුතු වීම. |
| (v) | 8.9.1 (ආ) සහ 8.9.3 වගන්තිය | ලංසුකරුගේ ලංසුව ප්‍රතිග්‍රහණය කිරීමෙන් අනතුරුව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත්, ලොතරැයිපත් බෙදාහැරීමේ කාර්යය සඳහා තෝරාගත් පුද්ගලිත ආයතනය සමඟ එම කොන්ත්‍රාත්තුව අවලංගු කරන දිනය දක්වා ගිවිසුමකට එළඹී | ඒ.බී.එස්. කුරියර් (පුද්.) සමාගම කොන්ත්‍රාත් මුදලින් සියයට 10 වන කාර්යය සාධන ඇප බැඳුම්කරය අදාල ආයතනය විසින් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුමට එළඹීමට නොහැකි වී ඇත. ප්‍රොන්ටෝ ලංකා කුරියර් සමාගමේ මව් සමාගම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුගමනය කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. එසේම 2022 ජනවාරි 18 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා තෝරාගත් අනෙක් පුද්ගලික ආයතනය සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණේ මාස 08 කට පසුව එනම් 2022 අගෝස්තු 16 දින දීය. | විදේශ රටක පිහිටා තිබීම මත අදාල ගිවිසුම අත්සන් තැබීම සඳහා බලය පැවරූ ලියවිල්ල (Board Resolution) මණ්ඩලය වෙත ලබා දීමටද ප්‍රමාණවත් කාලයක් ගතවී ඇත. | |
| (ඊ) ජාතික ලොතරැයි මණ්ඩලයේ 1963 අංක 11 දරන මුදල් පනතේ 20(3) උප වගන්තිය | • පනතේ විධිවිධාන අනුව මණ්ඩලය විසින් ලොතරැයි පැවැත්වීම සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් අනුමත කළ රීති ගැසට් පත්‍රයක පලකල යුතු වුවත්, මණ්ඩලය විසින් 2016 මැයි 21 දින, 2018 මැයි 25 දින හා 2022 ජනවාරි 27 දින ආරම්භ කරන ලද මෙගා පවර්, ධන නිධානය හා හඳහන යන ලොතරැයිපත්වල අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද රීති පනතෙහි විධිවිධාන ප්‍රකාරව ගැසට් පත්‍රයක පලකර නොතිබුණි. එසේම, මණ්ඩලය විසින් 2010 පෙබරවාරි 28 සිට 2022 මාර්තු 01 දක්වා කාලය තුළ විවිධ අරමුණු සඳහා ආරම්භ කරන ලද ලොතරැයි වර්ග 05 ක දිනුම් ඇදීමේ කටයුතු අත්හිටුවා තිබුණද, ඒ පිළිබඳව ගැසට් පත්‍රයක පලකර මහජනයා දැනුවත් කර නොතිබුණි. | සංශෝධිත රීති ඇතුලත් අවසන් කෙටුම්පත 2022 නොවැම්බර් 11 වෙනි දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් අනතුරුව එහි සඳහන් රීති කිහිපයක් සම්බන්ධයෙන් නැවත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙස 2023 ජනවාරි 03 දින දරන ලිපියෙන් දන්වා ඇත. | අදාල පනතේ විධිවිධාන පරිදි කටයුතු කලයුතු වීම |
| | • 2013 ජනවාරි 31 දිනැති අංක 1975/37 දරන අති විශේෂ ගැසට් | සංශෝධිත රීති ඇතුලත් අවසන් කෙටුම්පත 2022 නොවැම්බර් 11 වෙනි දින | අදාල පනතේ විධිවිධාන පරිදි කටයුතු කලයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | පත්‍රය අනුව ගොවිසෙත සහ ජාතික සම්පත යන ලොතරැයිපත්වලින් ත්‍යාග ප්‍රදානය සඳහා වෙන් කරනු ලබන මුදල ටිකට්පත් අලෙවි ආදායමෙන් සියයට 47 ක් සහ මණ්ඩලයේ ගිණුම සඳහා වෙන් කරන මුදල පිළිවෙලින් සියයට 24.25 ක් හා සියයට 19.25 ක් ලෙස දක්වා තිබුණද, 2021 පෙබරවාරි 17 දින සිට ඉහත ලොතරැයිපත් අලෙවි ආදායමෙන් පිළිවෙලින් සියයට 49 ක් හා සියයට 52 ක් ත්‍යාග ප්‍රදානය සඳහා සහ මණ්ඩලයේ ගිණුම සඳහා පිළිවෙලින් සියයට 22.25 ක් හා සියයට 19.25 ක් වෙන් කර තිබුණි. කෙසේවුවද, මේ සම්බන්ධයෙන් පනතේ විධි විධාන පරිදි ගැසට් පත්‍රයක් මගින් නිවේදනය කර නොතිබුණි. | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් අනතුරුව එහි සඳහන් රීති කිහිපයක් සම්බන්ධයෙන් නැවත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙස 2023 ජනවාරි 03 දින දරන ලිපියෙන් දන්වා ඇත. | වීම |
| (උ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරණ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2019 වසරේ සිට රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e – GP) යටතේ ලියාපදිංචි විය යුතු වුවත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් විගණිත දිනය වන විටත් එම ක්‍රමවේදය යටතේ ලියාපදිංචි වී ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි. | මේ වන විට විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ලියාපදිංචි වී ඇති අතර ඉදිරියේදී සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන් එම ක්‍රමවේදය යටතේ සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම. |

**1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ මණ්ඩලයේ බදු අයකල හැකි ලාභය වූ රු.1,292,310,780 ක් වෙනුවෙන් ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීමේ දී මුල් අර්ධ වර්ෂයේ ලාභය මත සියයට 24 ක අනුපාතයක් සහ දෙවන අර්ධ වර්ෂයේ ලාභය මත සියයට 30 ක අනුපාතයක් අදාල කර ගත යුතු වුවත්, මණ්ඩලය විසින් සම්පූර්ණ වර්ෂයේ ලාභය මත සියයට 24 බදු අනුපාතයක් අදාළ කර ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද රු.38,769,324 කින් අඩුවෙන් ගණනය කිරීමෙන් වර්ෂයේ බදු පසු ලාභය එම වටිනාකමන් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයට අදාළ ආදායම් බදු බැදියාව ගණනය කිරීමේ දී මුළු වර්ෂයටම සියයට 24 සැලකිල්ලට ගෙන ගණනය කිරීම සිදු කර ඇත. ඒ අනුව සංශෝධිත 2022 අංක 45 දරන දේශීය ආදායම් බදු පනත අනුව දෙවන අර්ධ වර්ෂය සඳහා සියයට 30 ක් ලෙස සංශෝධිත බදු අගය 2023 වර්ෂය තුළදී ගැලපීම් කර ඇත. | දේශීය ආදායම් බදු පනතේ විධි විධාන අනුව ආදායම් බදු ගෙවිය යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,085,769,648 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.960,349,617 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.125,420,031 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රවර්ථන වර්ෂයේ විකුණුම් ආදායම ඉහළ යාම සහ විකුණුම්, අලෙවිකරණ සහ බෙදාහැරීමේ වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය සතු වොක්ෂෝල් වීදියේ පිහිටි ඉඩමේ ව්‍යාපාරික පරිශ්‍රය ඉදිකිරීම සඳහා උපදේශාත්මක සේවා ලබා ගැනීම වෙනුවෙන් රු.27,178,359 ක් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වැය කර ජංගම නොවන වත්කම් යටතේ කෙරීගෙන යන වැඩ (Working Progress) ලෙස දක්වා තිබුණි. කෙසේවුවද, එම ගොඩනැගිල්ල ඉදිකිරීමට මේ දක්වා පියවර නොගැනීම නිසා මණ්ඩලය විසින් දරනු ලැබූ මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. | අදාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුදල් අමාත්‍යාංශ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා සිටියද අනුමැතිය ලබා දිය නොහැකි බව දන්වා ඇත. | අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමකින් තොරව වියදම් දැරීම සිදුනොකළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මණ්ඩලය සතු වොක්ෂෝල් වීදියේ පිහිටි ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකිරීමට නොහැකිවීම නිසා කුළී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක කාර්යාලය පවත්වාගෙන යන අතර 2022 දෙසැම්බර් 31 වන විට ඒ සඳහා රු. මිලියන 487 ක් බදු කුළී ලෙස ගෙවා තිබුණි. තවද, මණ්ඩලය විසින් කුළියට ගත් මෙම ගොඩනැගිල්ලෙන් කොටසක් අනවසර ලෙස ඉදිකර තිබූ අතර ඒ සඳහා රු.31,654,000 ක් ඉහත කුළී වියදම් යටතේ වැය කර තිබුණි. | එවකට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2018 අප්‍රේල් 03 දිනැති ලිපිය මඟින් දැනට රජයේ පවතින ප්‍රතිපත්ති අනුව නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අවසර ලබා දිය නොහැකි බව දන්වා එවා ඇත. | මණ්ඩලයට ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ කුළියට ගැනීම නිවැරදි ඇගයීමක් අනුව සිදුකළ යුතු වීම. |
| (ඇ) | මණ්ඩලය විසින් අවශ්‍යතාවය නිසි පරිදි සැලසුම් කර ප්‍රවර්ධන අයිතම මිලදීගැනීම සිදුකලයුතු වුවත්, 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රවර්ධන අයිතම ලෙස මිලදීගෙන තිබූ කාන්තා හා පිරිමි කුඩ පිළිවෙලින් ඒකක 460 ක් හා 384 ක් ගබඩාවේ ඉතිරිව තිබියදී, ඒවා බෙදා හැරීමකින් තොරව 2023 ජනවාරි 14 දින පවත්වන ලද මහජන සම්පත ජය කිංග් (Jaya King) 5000 විශේෂ දිනුම්වාරයේ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් තවත් පිරිමි කුඩ 4,200 ක් හා කාන්තා කුඩ 2,500 ක් රු.8,292,650 ක් වැය කර මිලදී ගෙන තිබුණි. කෙසේවුවද, ඉහත ලොතරැයිය පවත්වන ලද දිනට පිරිමි කුඩ 15 ක් පමණක් නිකුත් කර තිබීම නිසා ඉහත ප්‍රවර්ධන වැඩසටහන වෙනුවෙන් මණ්ඩලය වැය කළ මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. | මහජන සම්පත ලොතරැයියේ සුවිශේෂී සංධිස්ථානයක් වන එහි 5000 වන දිනුම් වාරය 2023 ජනවාරි 14 වන දිනට යෙදී තිබුණි. එම අවස්ථාව සඳහා අලෙවි ජාලය සහ පාරිභෝගිකයා වසර පුරා දිරි ගන්වමින් ලොතරැයි මිලදී ගැනීම සඳහා සහ විකිණීම ප්‍රවර්ධනය සඳහා නැඹුරුවක් ඇති කළ යුතුය. ඒ අනුව 2022 හා 2023 වර්ෂ සඳහා ප්‍රවර්ධන භාණ්ඩ සම්පාදනය මෙම ජය king වැඩසටහනට සමගාමීව සිදු කරන ලදී. | ලොතරැයියක ප්‍රවර්ධන වියදම් එම ලොතරැයිය පවත්වන දිනට පෙර වැයකර එමගින් අලෙවි ආදායම් වැඩිකිරීමට ක්‍රියා කළයුතු වීම. |

**3.2 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයට 2022 මාර්තු 05 දින සිට 2022 මැයි 04 දින දක්වා කාලයට ගොවිසෙත ලොතරැයිපත මුද්‍රණය කරගැනීම සඳහා මුද්‍රණ ආයතනයක් තෝරාගැනීමට නොහැකිවීමෙන් එම කාලසීමාවට සැලසුම් කළ ලොතරැයි දිනුම්වාර 55 ක් පවත්වා ගැනීමට නොහැකිවී තිබුණි. පසුගිය වර්ෂයේ ගොවිසෙත ලොතරැයි දිනුම්වාර 280 ක් පවත්වා රු.මිලියන 4,442 ක ආදායමක් උපයාගෙන තිබුණු | ඩොලර් ප්‍රේෂණ අර්බුදයත් සමඟ ලොතරැයි ව්‍යාපාරය තුළ උපරිම වෙළඳපල කොටස අත්කරගෙන සිටින ජාතික ලොතරැයි මණ්ඩලයේ මුද්‍රණකරුවන් ලොතරැයි මුද්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ කඩදාසි හිඟවීම හා ආනයන සීමා පැනවීම මත රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ද | ගිවිසුම අනුව ලොතරැයිපත් මුද්‍රණය කර සැපයීම සඳහා අදාල සැපයුම්කරුවන් ප්‍රමාණවත් අමුද්‍රව්‍ය තොග පවත්වාගත යුතුය. සැපයුම්කරුවන් විසින් කොන්දේසි කඩකිරීමකදී ගිවිසුම අනුව ක්‍රියාකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අතර, එක් දිනුම් වාරයක ආදායම ආසන්න වශයෙන් රු. මිලියන 15.86 ක් විය. ඒ අනුව ඉහත ගොවිසෙත ලොතරැයිපත් නොපැවැත් වූ දිනුම්වාර වෙනුවෙන් ආසන්න වශයෙන් රු. මිලියන 872.3 ක ආදායමක් මණ්ඩලයට අහිමිවී තිබුණි. | ඇතුලත්ව අර්බුදයකට මුහුණදුන් අතර ලොතරැයි දිනුම් 55 කදී ලොතරැයි ද්විත්වයක් පමණක් අත්හිටුවා ලොතරැයිපත් වෙළඳපල තුළ පවත්වා ගනිමින් ඒකාබද්ධ අරමුදලට අරමුදල් සම්පාදනය අඛණ්ඩව සිදු කර ඇත. | |
| (ආ) | NLB හඳහන ලොතරැයිපත මුද්‍රණය කිරීමට භාරගත් මුද්‍රණ ආයතනය දිනුම්වාර 2 කට පසුව ඩොලර් අර්බුදය සහ කඩදාසි හිඟකම මත එම ලොතරැයිපත මුද්‍රණය කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා මණ්ඩලය විසින් 2022 මාර්තු 05 දින සිට 2022 අප්‍රේල් 03 දක්වා NLB හඳහන ලොතරැයි දිනුම්වාර 29 ක් පවත්වා නොතිබුණි. මණ්ඩලය විසින් ඊට පෙර පවත්වා තිබූ NLB හඳහන ලොතරැයි දිනුම්වාර 37 හි සාමාන්‍ය ආදායම සැලකීමේදී හඳහන ලොතරැයිය නොපැවැත්වීම මත ආසන්න වශයෙන් රු. මිලියන 263 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි. | සිලෝන් බිස්නස් ඇප්ලයන්ස් (පුද්.) සමාගම NLB හඳහන පළමු දිනුම් වාරය මුද්‍රණය කිරීමෙන් අනතුරුව රටතුල උද්ගත වූ ඩොලර් ප්‍රේෂණ අර්බුදය හේතුවෙන් මුද්‍රණ අමුද්‍රව්‍ය ආනයනය කිරීමට නොහැකි වීම මත හඳහන ලොතරැයිපත් මුද්‍රණය කිරීමට හැකියාවක් නොමැතිබව දන්වන ලදී. 2022 වර්ෂයේදී රට තුල ඇති වූ ඩොලර් අර්බුදය හේතුවෙන් ලොතරැයිපත් මුද්‍රණය කිරීම සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය ආනයනය කිරීමට දැඩි බාධාවන් ඇති වීමෙන් ලොතරැයිපත් මුද්‍රණය කිරීමට මුද්‍රණ සංචිතය තුළ සිටි සියළුම මුද්‍රණ ආයතනයන්ට සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවටද නොහැකි තත්ත්වයක් උදා විය. | ගිවිසුම අනුව ලොතරැයිපත් මුද්‍රණය කර සැපයීම සඳහා අදාල සැපයුම්කරුවන් ප්‍රමාණවත් අමුද්‍රව්‍ය තොග පවත්වාගත යුතුය. සැපයුම්කරුවන් විසින් කොන්දේසි කඩකිරීමකදී ගිවිසුම අනුව ක්‍රියාකළ යුතු වීම. |
| (ඇ) | ඩොලර් ෆෝචූන් ලොතරැයිපත 2016 වර්ෂයේ අලෙවි කිරීම ආරම්භ කර තිබූ අතර එම ලොතරැයිපත දිනුම් ඇදීම සඳහා 2022 දෙසැම්බර් 09 දින දක්වා වසර 6 ක අධික කාලයක් ගත කර තිබුණද, මුද්‍රණය කර තිබූ ටිකට්පත් 30,000 න් ටිකට්පත් 6,603 ක් හෙවත් සියයට 22 ක් පමණක් විකුණා මුදල් ලබාගෙන තිබුණි. ඒ අනුව දිනුම් අදින ලද දිනට අලෙවිකර තිබූ ටිකට්පත්වලට ලැබුණු ආදායම සහ එම ලොතරැයිපතේ ත්‍යාග මුදල් පිරිවැය පමණක් සැලකීමේදී ජාතික ලොතරැයි මණ්ඩලයට ඇ.ඩො. 33,970 හෙවත් ආසන්න වශයෙන් රු.12,263,170 ක අලාභයක් දැරීමට සිදුවී තිබුණි. | වසර 06 කට අධික කාලයක් ලොතරැයිපත් 6,603 ක් පමණ අලෙවි කිරීමට හැකි වී ඇත. එබැවින් අලාභයට වඩා ජනතා විශ්වාසය සැලකිල්ලට ගනිමින් වසර 06 පසු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා නිර්දේශ මත මෙම ඩොලර් ෆෝචූන් ලොතරැයියේ විශේෂ දිනුම් ඇදීම සිදු කර ඇත. | නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමේදී එහි අලෙවි ඉලක්ක හැකිතාක් නිවැරදි ලෙස ඇස්තමේන්තු කර එම අලෙවි ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට ක්‍රියා කල යුතු විම හා සාධාරණ කාලයක් තුළ එම ලොතරැයිය පැවැත්වීමට ක්‍රියාකළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) මණ්ඩලය විසින් ඩොලර් ෆෝචූන් ලොතරැයිපත් 6,869 ක් විකුණූ බවට දක්වා තිබූ අතර, ලොතරැයිපත් 6,603 කින් පමණක් මුදල් ලැබී තිබුණි. ඒ අනුව ලොතරැයිපත් 266 කින් මුදල් අයවී නොතිබුණි. එම ලොතරැයිපත් 266 ට අදාලව මුදල් අයවිය යුතු පුද්ගලයන් හඳුනාගෙන මුදල් අයකර ගැනීමකින් තොරව 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.964,678 ක් ප්‍රතිපාදනය කර තිබුණි. | ඩොලර් ෆොර්චූන් ලොතරැයිපත් 6,869 ක විකුණුම් ප්‍රමාණයෙන් ලොතරැයිපත් 6,603 ක පමණක් මුදල් ලැබී තිබුණි. ඉතිරි ලොතරැයිපත් 266 සඳහා දිනුම් ඇදීම සිදු කරන දින දක්වා මුදල් ලැබී නොතිබුණි. | අලෙවිය සඳහා ලොතරැයිපත් නිකුත් කිරීම් පරීක්ෂා කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාකළ යුතු වීම. |
| (ඉ) ඉහත ලොතරැයිපත්වලින් කොටසක් අලෙවිකිරීම සඳහා මණ්ඩලයේ අලෙවි අංශය වෙත ලබාදී තිබූ අතර එලෙස ලබාදුන් ටිකට්පත්වලින් 552 ක් අස්ථානගතවී තිබුණි. එම අස්ථානගත වූ ටිකට්පත්වලට සිදුවූයේ කුමක්ද යන්න මෙතෙක් තහවුරු කර ගෙන නොමැති අතර 2022 දෙසැම්බර් 31 දිනට එම ලොතරැයිපත් 552 හි වටිනාකම ඇ.ඩොලර් 5,520 ක් හෙවත් ආසන්න වශයෙන් රු.2,029,262 පමණ වී තිබුණි. | විකිණීම සඳහා ලබා දුන් නමුත් ආපසු භාර නොදුන්, හඳුනා ගැනීමට නොහැකි ලොතරැයිපත් ප්‍රමාණය 552 ක් වේ. | වගකිවයුතු පාර්ශවයන් ගෙන් අයකර ගැනීමට ක්‍රියාකළ යුතු වීම. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීවයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1963 අංක 11 දරන මුදල් පනත මගින් ජාතික ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කර ඇති අතර ඉන් පසු එම පනතේ වගන්ති කීපයක් 1997 සහ 1998 වර්ෂවලදී සංශෝධනය කර තිබුණි. කෙසේ වුවද, වර්තමානයේ මණ්ඩලයේ අරමුණුවලට ගැලපෙන පරිදි නව පනතක් කෙටුම්පත් කිරීමට 2017 පෙබරවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/17/0295/719/026 මගින් අනුමැතිය ලබාදී වසර 6 ක් ගත වී තිබුණද, නව පනතක් සකස් කිරීමට මණ්ඩලය මේ දක්වා අපොහොසත් වී තිබුණි. | ජාතික ලොතරැයි මණ්ඩලයේ වර්තමාන අරමුණු වලට ගැළපෙන පරිදි නව කෙටුම්පතෙහි අවසාන අදියර නිම කිරීමට ප්‍රථම අමාත්‍ය මණ්ඩල සංශෝධනය මත නැවත නව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගත යුතු බව නීති කෙටුම්පත් සම්පාදක විසින් දන්වා ඇති අතර එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය. | පවතින පනතේ අඩුපාඩු නිවැරදිවන ආකාරයට සහ නව වෙනස්වීම් අනාවරණය වන ආකාරයට පනතට සංශෝධන ගෙන ඒම හෝ නව පනතක් සකස් කිරීමට ක්‍රියා කළ යුතු වීම. |
| (ආ) ජාතික ලොතරැයි මණ්ඩලය තම දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් සමඟ අත්සන් කරනු ලබන ගිවිසුම අනුව, සාමාන්‍ය ලොතරැයි දිනුම් ඇදීම් වාරයන්හීදී සියළු දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් විසින් | දිනුම් අදින ලොතරැයි සඳහා ණය ශේෂය වන රු.196,211,722 ක වටිනාකම තුල දින 30 ට අඩු ණය වටිනාකම රු.175,898,890 ක් | ණයගැතියන්ගෙන් ණය කාල සීමාව තුළ මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අත්පිට මුදලට ලොතරැයිපත් මිලදී ගත යුතු වන අතර විශේෂිත දිනුම් වාරයන්හී දී ණය පදනමට මිලදීගත හැකිය. එසේ වුවත් අදාල විශේෂිත දිනුම් වාරය පවත්වා වැඩ කරන දින 3 ක් ඇතුළත එම ණය මුදල සම්පූර්ණයෙන් පියවිය යුතුය. එසේම SMS මඟින් ලොතරැයි පත් අලෙවි කරන අලෙවි නියෝජිතයින් 03 කට හා කාර්ය මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ට ණය පදනම මත ටිකට්පත් නිකුත් කරන නමුත් අදාල දිනුම් වාරය පවත්වා දින 30 ක් ඇතුළත එකී මුදල සම්පූර්ණයෙන් පියවිය යුතුය. කෙසේ වුවද එම මූලික එකඟතාවයන්ට පටහැනිව 2022 දෙසැම්බර් 31 දිනට දින 30 ඉක්ම වූ ණයගැති ශේෂය රු.32,001,952 ක් වී තිබුණි. | වේ. දිනුම් අදින ලොතරැයිපත් සඳහා දින 30 ඉක්මවූ ඉතිරි ණය වටිනාකම රු.20,312,832 ක් වන අතර ඉන් අලෙවි නියෝජිතයින් 09 ක ගෙන් අය විය යුතු වටිනාකම රු.10,159,094 වේ. | |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දින වන විට ලොතරැයි පත් අලෙවි කරන අයගෙන් රු.238,530,755 ක් අයවිය යුතුව තිබුණි. ලොතරැයි පත් අලෙවි කරන අයවලුන් විසින් ඒ සඳහා ඇපකරයන් තැබිය යුතුව තිබුණත්, එකතුව රු.40,960,581 ක ණයගැති වටිනාකම සඳහා පමණක් එලෙස ඇපකර තබා තිබුණි. ඒ අනුව විශේෂ දිණුම් වාරයන්ට වූ ණයට විකුණුම් හැර ලොතරැයිපත් අලෙවිකරණ ණයගැති ශේෂයෙන් සියයට 11 ක් හෙවත් රු.27,210,670 ක ණය ශේෂ සඳහා බැංකු ඇපකර ලබා ගෙන නොතිබුණි. | ණය අයකර ගැනීම සඳහා ලිපි මඟින් දැනුවත් කර ඇති අතර ණය ගැතියන් කීප දෙනෙක් කොටස් වශයෙන් ගෙවමින් සිටී. අනිකුත් ණය ගැතියන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන ඇත. | ණයට විකිණීම මත ඇතිවන අලාභ අයකර ගැනීම සඳහා අවශ්‍ය ඇප සුරකුම් ලබාගත යුතුවීම. |
| (ඈ) | 2022 දෙසැම්බර් 31 දිනට වාර්තා කළ මුළු ණයගැති වටිනාකමින් වර්ෂ 05 ක් ඉක්මවූ ණයගැතියන් රු.15,969,774 ක් වූ අතර ඉන් රු.14,223,839 ක් වූ ණයගැති ශේෂය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම වසර 1-5 ත් අතර ණයගැතියන් වටිනාකම වූ රු.10,011,554 ක් අයකර ගැනීමට හෝ ඉන් බැංකු ඇපකර සහිත ණයගැතියන් වටිනාකම වූ රු.1,047,490 න් බැංකු ඇපකර මුදල් කර ගැනීමට හෝ මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | මෙම ණයගැති වටිනාකමෙන් දිනුම් අදින ලොතරැයිපත් සඳහා රු.2,710,613 ක්, ක්ෂණික ලොතරැයිපත් සඳහා රු.8,748,881 ක් සහ කොළඹ ගුවන්තොටුපල සුපිරි ලොතරැයිය සඳහා රු.4,510,280 ක් වේ. | ණයගැතියන්ගේ ණය කාල සීමාව ඉක්මවා යාමට පෙර අදාල මුදල් අයකර ගැනීමට ක්‍රියාකළ යුතු වීම. |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනට දරුදිරි සම්පත, සම්පත ලග්න වරම, මනුසත් මෙහෙවර, | 2023 පෙබරවාරි මස මාසික ගිණුම් සැකසීමේදී අදාල ගිණුම් | දිණුම් ඇදීම අවසන් කර ඇති ලොතරැයිපත්වල සංචිත |

| | | | |
|---|---|---|---|
| | රන් කිරුළ හා රජ දිනුම, සෙවණ පැසිව් යන ලොතරැයි පවත්වා මාස 06 කට වැඩි කාලයක් ගත වී තිබුණි. ඉන් දරු දිරි සම්පත, සම්පත ලග්න වරම, සෙවණ පැසිව් ත්‍යාග සංචිත අරමුදල්වල අවාසිදායක ශේෂය වූ රු.6,297,864 ක් සහ මනුසත් මෙහෙවර, රන් කිරුළ, රජ දිනුම ත්‍යාග සංචිත අරමුදල්වල වාසිදායක ශේෂය වූ රු.10,150,180 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | වෙත මාරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | ශේෂයන් නිවැරදි ගිණුම්වලට ගලපා ගිණුම් නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතු වීම. |
| (ඊ) | ජාතික ලොතරැයි මණ්ඩලයේ මන්නාරම සංචාරක නිවාසය ඉදිකිරීම වෙනුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවිය යුතු රු.2,335,562 ක මුදලක් සහ අදාළ ඉදිකිරීමේදී රැඳවුම් මුදල් ලෙස රඳවාගත් රු.2,729,526 ක් ලෙස එකතුව රු.5,065,088 ක් නිරවුල් කිරීමකින් හෝ අදාල කාර්යන් නිවැරදිව ඉටුකරවා ගැනීමකින් තොරව 2020 වර්ෂයේ සිට ගෙවිය යුතු ශේෂයක් ලෙසින් වෙළඳ හා අනෙකුත් ණය හිමියන් යටතේ දක්වා තිබුණි. | මේ වන තෙක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදු කරන ලද අලුත්වැඩියාවන් සඳහා ඉදිරියේදී අදාල බිල්පත් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. | රඳවාගත් මුදල් නිරවුල් කිරීමට පෙර අදාල කාර්ය නිවැරදි ලෙස ඉටුකර ඇතිබවට ඉංජිනේරුමය සහතිකයක් ලබාගැනීමට ක්‍රියාකළ යුතු වීම. |
| (උ) | වාසනා සම්පත, ජයවිරු, දරුදිරි සම්පත, සම්පත ලග්න වරම සහ සෙවණ පැසිව් යන ලොතරැයිපත් දිණුම් ඇදීම මණ්ඩලය විසින් 2022 මාර්තු 01 වන විට නතර කර තිබූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට එම දිනුම් ඇදීම් නවත්වා මාස 06 ක් ඉක්මවා තිබූ ත්‍යාග වටිනාකම රු.63,687,263 ක් විය. කෙසේවුවද, ජයග්‍රාහකයින් ඉදිරිපත් නොවූ මෙම ත්‍යාග මුදල් හිමිකම් නොපෑ ත්‍යාග ලෙස හඳුනාගෙන ඊට අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙහි සඳහන් වාසනා සම්පත, දරු දිරි සම්පත, සම්පත ලග්න වරම සහ සෙවණ පැසිව් ලොතරැයිපත් අලෙවිය අලාභදායි වීම මත එම ලොතරැයිපත් දිනුම් ඇදීම පවත්වා ගෙන යාම අත්හිටුවා ඇති අතර ඒ අනුව එම සංචිතයන්ගේ ඉතිරි සංචිත මුදල් පෙර ලබා ගත් සංචිත වෙතම නැවත බැර කිරීමට නියමිතය. | මාස 06 ඉක්මවූ හිමිකම් නොපෑ ත්‍යාග මුදල් ඒකාබද්ධ අරමුදලට ලබාදීමට ක්‍රියාකළ යුතු වීම. |
| (ඌ) | මණ්ඩලය විසින් රු.2,383,619 ක් වැයකර ලොතරැයි තෑගි භාණ්ඩ ලෙස ඉදිරිපත් කිරීම සඳහා මිලදීගෙන තිබූ Apple iphone, Laptop, රූපවාහිණී සහ ශීතකරණ වැනි තෑගි වර්ග 08 ක අයිතමයන් 19 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වගකීම් කාලය ඉකුත්වී ගබඩාව තුළ පැවැතුණි. | සෑම භාණ්ඩයක්ම සෑම විශේෂ දිනුම් වාරයක් වෙනුවෙන්ම යොදා ගත නොහැකි බැවින් ජයග්‍රාහකයින් ඉදිරිපත් නොවීම මත ඉතිරි වන භාණ්ඩ නැවත යොදා ගැනීමත් අතර යම් කාල පරාසයක් සහිත බැවින් ගබඩාවේ එතෙක් එම භාණ්ඩ ඉතිරිව පවතී. | වගකීම් සහතික කාලසීමාව තුළ අදාල ලොතරැයි තෑගි භාණ්ඩ ජයග්‍රාහකයින් වෙත පිරිනැමීම සඳහා අවශ්‍ය පියවර ගතයුතු වීම. |

ගබඩාවේ පැවැති ඇතැම් තෑගි භාණ්ඩ නැවත තෑගි ලෙස ඉදිරිපත් කිරීමට තරම් යෝග්‍ය තත්ත්වයක නොපවතින බවට නිරීක්ෂණය වන අතර, මේ සම්බන්ධයෙන් කළමණාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් මහජන සම්පත ලොතරැයිය දිනුම් ඇදීම සඳහා උපයෝගී කරගන්නා යන්ත්‍රය විධිමත් පරිදි ක්‍රියාත්මක නොවීම, යන්ත්‍ර මගින් ලබාගන්නා ඉලක්කම්, අකුරු හා ලග්න නිවැරදි ලෙස එක් වරම යන්ත්‍ර මගින් ලබා නොදීම හා එම ඉලක්කම්, අකුරු හා ලග්න සහිත බෝල යන්ත්‍ර තුළ හිරවීම හේතුවෙන්, යන්ත්‍ර නැවත නැවත ක්‍රියාත්මක කිරීමට සිදුවූ අවස්ථා දිණුම් ඇදීමේ කාර්ය සඳහා සහභාගිවන විගණන කාර්ය මණ්ඩල විසින් නිරීක්ෂණය කර ඇති අතර, 2021 වර්ෂයේ කෙටුම්පත් විගණන වාර්තාව මගින්ද මේ සම්බන්ධයෙන් පෙන්වා දී තිබුණි. කෙසේවුවද, 2022 වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මට සහ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණු රු.මිලියන 150 ක් වූ Ball Drawing යන්ත්‍රය 2023 අප්රේල් 10 දින දක්වා මිලදී ගැනීමට මණ්ඩලය අපොහොසත්වී තිබුණි. | මහජන සම්පත ලොතරැයිපතෙහි දිනුම් ඇදීමේ කටයුතු සිදු කරනු ලබන දිනුම් ඇදීමේ යන්ත්‍රය වසර පහළොවකට වඩා වැඩි කාලයක් භාවිතා කරන බවත්, ජාතික සම්පත දිනුම් ඇදීමේ යන්ත්‍රයෙහිද මේ වන විට ඇතැම් අවස්ථාවන්හිදී දෝෂ සහගත තත්ත්වයන් පැන නැඟී ඇති බැවින් හා මෙම යන්ත්‍ර දෙක සඳහා හදිසි අවස්ථාවකදී භාවිතයට ගැනීමට හැකි උපස්ථ යන්ත්‍රයක් හෝ නොමැති නිසා කුටීර හතකින් සමන්විත දිනුම් ඇදීමේ යන්ත්‍ර දෙකක් එකවර මිල දී ගැනීම සඳහා මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමට ප්‍රසම්පාදන අස්රීත්වය වෙත උපදෙස් ලබා දී ඇත. | ලොතරැයි දිණුම් ඇදීම වඩා නිවැරදිව සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගතයුතු වීම. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ලොතරැයි දිනුම් ඇදීම්වලදී ත්‍යාග ලෙස ලබාදීම සඳහා 2015 වර්ෂයේ සිට මිලදීගෙන තිබුණු රු.810,311 ක් වටිනා රන් කාසි සහ රන් භාණ්ඩ ඒකක 43 ක ප්‍රමාණයක් අදාල කාර්යය සඳහා යොදා ගැනීමකින් තොරව බැංකු සේප්පුවල තැන්පත් කර තිබුණි. එහි වර්තමාන වටිනාකම රු.4,482,935 ක් වී තිබුණි. | මීට ප්‍රථම විශේෂ වාර වල අතිරේක ත්‍යාග ලෙස ජයග්‍රාහකයින් වෙත ලබා දීමට මිලදී ගෙන ජයත්‍රාහකයින් ඉදිරිපත් නොවීම මත 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති රන් භාණ්ඩ අයිතම 43 ක් පැවතුණි. | ඉතිරිවන තෑගි භාණ්ඩ ඉදිරි ලොතරැයි දිනුම් ඇදීම් වාරවලට යොදාගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. |

### 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් 2018 ජුනි මාසයේදී ලොතරැයි වර්ග 04 ක මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීමට අදාළ ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබූ අතර, ලංසු ලියවිලි නිවැරදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව පිළියෙල කර නොතිබීම නිසා ඉන් වසරකට පසුව එනම් 2019 මැයි මාසයේදී එම ප්‍රසම්පාදන කටයුතු අවලංගු කර තිබුණි. නැවත 2020 පෙබරවාරි 14 දින ලොතරැයි වර්ග 09 ක් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීමට අදාල ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබුණද, නිවැරදි ප්‍රසම්පාදන අධිකාරී සීමාව තුළ එම කටයුතු සිදු නොකිරීම නිසා ඉන් වසර 01 යි මාස 04 කට පසුව 2021 ජුනි 21 දින එම ප්‍රසම්පාදනය අවලංගු කිරීමට සිදුවී තිබුණි. එසේම නැවත 2021 ජුනි 25 දින එම ලොතරැයි වර්ග 09 සඳහා නැවත වරක් ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබූ අතර, ලංසු ප්‍රදානය කිරීම සඳහා 2023 අප්‍රේල් 01 දින දක්වා වසර 01 යි මාස 09 ක් ගත වී තිබුණි. ඒ අනුව, ජාතික ලොතරැයි මණ්ඩලයට 2019 සැප්තැම්බර් 01 දින සිට 2023 මාර්තු 31 දින තෙක් නිවැරදි ප්‍රසම්පාදනයක් මගින් ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමට නොහැකි වී තිබුණි. | 2021 ජුනි මස ආරම්භ කරන ලද ප්‍රසම්පාදනය පිරිනැමීම සඳහා සැලකිය යුතු මට්ටමේ කාලයක් ගතවී ඇති අතර 2023 පෙබරවාරි 13 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් ලංසු පිරිනැමීමට අනුමැතිය ලබා දීමෙන් අනතුරුව 2023 අප්‍රේල් 01 දින සිට 2024 මාර්තු 31 දින දක්වා වසරක කාලපරිච්ඡේදයක් සඳහා ලොතරැයිපත් මුද්‍රණය කිරීමේ කටයුතු නව මුද්‍රණ ආයතන වෙත පිරිනැමීම සිදු කර ඇත. | ලොතරැයිපත් මුද්‍රණය කරගැනීමේ ප්‍රසම්පාදන කාර්යයන් සාධාරණ කාලයක් තුළ අවසන් කිරීමට පියවර ගතයුතු වීම. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත වර්ෂයක කාලසීමාවක් සඳහා ලොතරැයිපත් ප්‍රසම්පාදනයට සුදුසු සැපයුම්කරුවන් තෝරාගැනීමට අපොහොසත් වීම නිසා 2019 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මාස 06, මාස 04, මාස 02, මාස 01 වැනි කෙටි කාල පරිච්ඡේදවලට ලොතරැයිපත් මුද්‍රණය කරවා ගැනීම සඳහා අවස්ථා 68 කදී 2019 වර්ෂයට පෙර සිටි සැපයුම්කරුවන් වෙතටම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14 විධිවිධානවලට පටහැනිව කාල දිගු | අදාල අවස්ථාව සහ පරිසර සාධකයන්ට අනුචිතව ලොතරැයිපත් වෙළඳපොල සඳහා අඛණ්ඩව ලොතරැයිපත් සැපයීමේ අරමුණින් පවත්නා මුද්‍රණ ආයතනයන්ගේ කොන්ත්‍රාත් ගිවිසුම් කාලය අධ්‍යක්ෂ මණ්ඩල සහ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ වරින් වර දීර්ඝ කිරීම සිදු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ලබා දෙමින් ලොතරැයිපත් මුද්‍රණය කරවා ගෙන තිබුණි. | | |
| (ඇ) | මණ්ඩලය 2022 වර්ෂය තුළදී ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ ගොවිසෙත සහ හඳහන ලොතරැයිපත් දෙක සඳහා මාස 4 බැගින් අවස්ථා 2 දී ලොතරැයිපත් මුද්‍රණය කරගැනීමට ආයතනයක් තෝරාගෙන තිබුණු අතර සීමිත තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ මාස 1 බැගින් අවස්ථා 5 දී ඉහත ලොතරැයිපත් දෙක සඳහා මුද්‍රණ ආයතන තෝරාගෙන තිබුණි. කෙසේ වුවද, ගොවිසෙත ලොතරැයිපත මුද්‍රණය කිරීමට භාරගෙන පසුව එම සැපයීම ප්‍රතික්ෂේප කළ ආයතනය මගින් මණ්ඩලයට වූ අලාභය කාර්යසාධන බැඳුම්කරය මගින් අයකර ගැනීමට කටයුතු නොකර නැවත වරක් 2022 ඔක්තෝබර් 31 සිට 2022 නොවැම්බර් 30 දක්වා කාලයට ගොවිසෙත ලොතරැයිපත මුද්‍රණයකර සැපයීමට තෝරාගෙන තිබුණි. | ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් සියලුම සැපයුම්කරුවන් හට පොදුවේ මෙම තත්ත්වය උදාවූ අතර එම තත්ත්වය ඉතා පැහැදිලිව ප්‍රථමයෙන්ම සිලෝන් බිස්නස් ඇප්ලයන්ස් (පුද්.) සමාගමටත් පිළිවෙලින් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවටත් බලපෑ අතර පොදු සාධක සහ මුද්‍රණ ක්ෂේත්‍රයේ ආරක්ෂිත මුද්‍රණ කටයුතු සිදු කරන ආයතනයන්ද ඉතා සීමිත බැවින් ඩී. පී. ජේ. හෝල්ඩින්ස් (පුද්.) සමාගම විසින් ඉදිරිපත් කර තිබූ කාර්ය සාධන ඇප බැඳුම්කර අය කර ගැනීමට හෝ අසාදු ලේඛණයට ඇතුළත් කිරීමට කටයුතු කර නොමැත. | ගිවිසුම් කඩකළ පාර්ශවයන් වෙතින් මණ්ඩලයට වූ අලාභ අයකර ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |
| (ඈ) | මණ්ඩලය විසින් 2022 ජනවාරි 20 දින දක්වා අලෙවිකරණ ලද සුපිරි වාසනා ලොතරැයිපත වෙනුවට NLB හඳහන නමින් නව ලොතරැයිපතක් 2022 ජනවාරි 27 දින සිට ආරම්භ කර තිබුණි. කෙසේවුවද, NLB හඳහන ලොතරැයිපත මුද්‍රණය කර සැපයීමේ කාර්යය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධානවලට අනුකූළ නොවන පරිදි ලංසු කැඳවීමකින් තොරව එතෙක් සුපිරි වාසනා ලොතරැයිපත මුද්‍රණය කළ ආයතනය වෙතටම මුද්‍රණ කටයුතු භාරදී තිබුණු අතර ගිවිසුමකට එළඹී නොතිබුණි. | පවත්නා ලොතරැයිපතක නාමය වෙනස් කර නැවත වෙළඳපොලට නිකුත් කිරීමේදී ඒ වන විට එම ලොතරැයිපත මුද්‍රණය කරනු ලබන මුද්‍රණ ආයතනයටම මුද්‍රණ කටයුතු ලබා දීම ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මේ වන තෙක් භාවිතා කරන ලද ක්‍රමවේදයයි. ඒ අනුව, ඒ වන විට සුපිරි වාසනා ලොතරැයිපත මුද්‍රණය කිරීමේ කටයුතු සිදු කරන ලද මුද්‍රණ ආයතනය වන සිලෝන් බිස්නස් ඇප්ලයන්සස් (පුද්) සමාගම හරහා පවත්නා මුද්‍රණ ගාස්තු යටතේම NLB හඳහන ලොතරැයියට අදාල මුද්‍රණ කටයුතු සිදු කිරීම සිදු කල අතර එම මුද්‍රණයන් සමඟ පැවති ගිවිසුම නව ගිවිසුමක් ලෙස ඇති කර ගැනීමේ අවශ්‍යතාවයක් පැන නැඟී නොමැත. | ලොතරැයිපත මුද්‍රණය කර සැපයීමේ කාර්යය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධානවලට අනුකූළ ක්‍රියා කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්යේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ 2022 වර්ෂයේ අයවැය 2021 දෙසැම්බර් 29 දින අනුමත කර තිබූ අතර එම අයවැය පසුව 2022 අගෝස්තු 16 සහ 2022 ඔක්තෝබර් 31 දිනවලදී නැවත සංශෝධනය කර තිබුණි. කෙසේවුවද, මෙම මුල් අයවැය ඇස්තමේන්තු දෙවන වර සංශෝධනය කිරීමේදී සියයට 12 සිට සියයට 40 දක්වා අඩුකර තිබූ අතර එම දෙවන සංශෝධිත අයවැය ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල තත්‍ය වටිනාකම් අතර සියයට 19 සිට සියයට 58 ක වෙනස්වීම් නිරික්ෂණය විය. මේ අනුව ඵලදායි පාලන උපකරණයක් ලෙස අයවැය උපයෝගී කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | රට තුල පැවති අධි උද්ධමනකාරී තත්වය, විදේශ සංචිත අඩු වීම මත වූ විදේශ විනිමය අර්බුදය සහ දේශපාලන අර්බුදකාරී වාතාවරණය සහ රජයේ වියදම් කළමනාකරණයට සමගාමීව නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව ආයතනය කළමණාකාරිත්වයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍යතාවය මත අවස්ථා 3 කදී අයවැය සංශෝධනය කරන ලදී. | අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී මණ්ඩලයට බලපාන සීමාකාරී සාධක සැලකිල්ලට ගෙන හැකිතාක් නිවැරදිව සිදුකිරීම මගින් මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඵලදායි පාලන උපකරණයක් ලෙස භාවිතා කළ යුතුය. |